# Kaleidoscope
# මොහොමඩ් නසීර් ගේ සිතුවම් ප්‍රදර්ශනය




**හනීෆ් මොහිනුඩීන්**

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ සම්ප්‍රදායික වෙස්මුහුණු කලාව පසුබිම් කරගෙන ඒ හා සම්බන්ධ විවිධාකාර හැඟීම් දනවන සිතුවම් පෙළක් මොහොමඩ් නසීර් ගේ තෙලිතුඩින් නිර්මාණය වී ඇත. මෙම ප්‍රදර්ශනය බහුරූප්‍රේක්ෂන නමින් (Kaleidoscope) එළිදැක්වීම ට නියමිතය.

ඔහු ලැබූ ගැඹුරු අස්වැසිල්ලකින් ගම්‍යවූ හැඟීම් සමුදායක් ඔහුගේ තෙලිතුඩින් ඔප්නැංවුනු සිතුවම් පෙළට ජීවයක් ලබාදීමට සමත්ව ඇත.

තෙල් සායම් සහ පැස්ටල් යන මාධ්‍ය යොදාගනිමින් ඉදිරිපත් වන්නාවූ මෙම සිතුවම් කලාව, ඔහු විසින් ස්වයං ඉගෙනුමකින් ඔප්නංවා ගත්තකි. වෘත්තීයම වශයෙන් මැදපෙරදිග යාන්ත්‍රික ඉංජිනේරු රැකියාවෙහි නියුතුවී ඇති අතර එම නිලකාලය තුළ මහා පරිමාණයේ විවිධ පිළිරූ, තෙල් සායම් සහ සිතුවම් ඇඳීමේ කටයුතු වල නියුතුවූ සමෘධිමත් ව්‍යාපාරිකයෙකි. ඔහු වසර 20 ක පමණ කාලයක් මෙල්බන් හි පදිංචිව සිටින අතර දැනට පාරම්පරික සහ සාම්ප්‍රදායික චිත්‍ර සහ ඡායාරූප රාමු කිරීමේ කටයුතු ඇතුළත් තමන්ගේම ව්‍යාපාරයක් පවත්වාගෙන යයිග

සහජ කුසලතා පූර්ණ ක්‍රිකට් ක්‍රීඩකයෙකුවූ ඔහු තම දක්ෂතාවය මත යාපනයේ මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දරා ඇති අතර, මිඩ්ල්සෙක්ස් විශ්වවිද්‍යාලයේ (Middlesex University) ක්‍රිකට් කණ්ඩායම ද නියෝජනය කර ඇත. එසේ හෙයින් ක්‍රිකට් ක්‍රීඩාව ඔහුගේ සිතුවම් කලාවට ද මහත් පිටිවහලක් වූ බව කිය යුතුය.

දිගු කාලයක් ක්‍රිකට් ක්‍රීඩාවේ නියුතුවූ ඔහු තම අත්දැකීම් මත ඔහුගේ පාසල් කාලයේ දී දේශීය ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ පුරාවෘත්ත ඇතුළත් විකට චිත්‍ර ඇඳීම සඳහා ස්වභාවයෙන්ම දක්ෂතා දැක්වූ අතර, එයින් මහත් ජනප්‍රියත්වයක්ද ලබා ඇත. සුප්‍රකට ක්‍රිකට් ක්‍රීඩක සංගක්කාර ගේ කවර් ඩ්‍රයිව් (cover drive) ක්‍රිකට් විලාශය නිරූපනය වන මූර්ති චිත්‍රය ඔහු විසින් නිර්මිත භාවාත්මක චිත්‍ර අතර මුල් තැනක් ගනී.

මොහොමඩ් නසීර් ගේ නූතන චිත්‍ර සිතුවම් වල බහුල වශයෙන් දිදුලන පැහැයන් කැටිවූ, විචිත්‍ර වූ හසුරු රේඛාවන් බහුල වශයෙන් දක්න ට ඇත. අභිරුචිය දනවන මෙම භාවාත්මක චිත්‍ර ශෛලීන්, ප්‍රවීණ චිත්‍ර ශිල්පී සේනක සේනානායකයන්ගේ චිත්‍ර වලින් ලත් ආභාසයකි. විවිධ සත්ව වර්ග, ගොඩැලි සහිත භූතල දර්ශන, ප්‍රධාන දුම්රිය ස්ථානය , ත්‍රීරෝද රථ ගාල වැනි ස්ථානයන් ද, සංස්කෘතික ලක්ෂණ කැටිවූ ප්‍රතිමා ආදී තේමාවන් ඔස්සේ ඔහුගේ සිත්තම් නිර්මාණය වී ඇත.

“ Kaleidoscope “ නමැති මෙම සිතුවම් ප්‍රදර්ශනය මොහොමඩ් ගේ කුළුදුල් ප්‍රයත්නයයි. මාර්තු 14 සිට 25 දක්වා Mount Waverley හි Highway චිත්‍රාගාරයේදී පැවැත්වේ.

THE HIGHWAY GALLAERY 14 The Highway Mount Waverley Victoria 3149

14-25 March2018 daily from12-4pm(except Mon & Tues)

මොහොමඩ් නසීර් ගේ සිතුවම් සහ චිත්‍ර පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා පහත සඳහන් වෙබ් අඩවි වලට පිවිසෙන්න.

www.facebook.com/picturesquesframingandfinearts/

www.facebook.com/events/397428660708606/?ti=cl

## විනී හෙට්ටිගොඩ




**People generally see what they look for, and hear what they listen for**